ඌව පළාත් සභාව 2017
------------------------------
ඌව පළාත් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
--------------------------------------------------------------
මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
----------------------
මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------
මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

2.2.1 පළාත් සභා අරමුදල
----------------------

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2018 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

2.2.2 අනෙකුත් ගිණුම්
------------------

සමාලෝචිත වර්ෂයට අදාළව 2018 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | 2017 වර්ෂයට අදාළ | | | |
|---|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව | ඉකුත් වර්ෂවලට අදාළව ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i) | විසර්ජන ගිණුම් | 29 | 29 | - | - |
| (ii) | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 29 | 29 | - | - |
| (iii) | ආදායම් ගිණුම් | 01 | - | 01 | - |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 08 | 07 | 01 | - |
| (v) | අරමුදල් ගිණුම් | 10 | 10 | - | - |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 02 | 01 | 01 | 01 |
| (vii) | පළාත් සභා මන්ත්‍රී අත්තිකාරම් ගිණුම | 01 | 01 | - | - |
| | | 80 | 77 | 03 | 01 |

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු
----------------------
පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඌව පළාත් සභාවේ ආයතන 18 ක ඉඩම් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. 24,200,290 ක් වූ ඉඩම් වටිනාකම වෘත්තීය සුදුසුකම්ලත් තක්සේරුකරුවන් විසින් තක්සේරු කර නොතිබුණි.

(ආ) ආයතන 2 ක විසර්ජන ගිණුම් අනුව දක්වා තිබුණු ගොඩනැගිලි හා කෙරීගෙන යන ඉදිකිරීම් වැඩවල වටිනාකම වූ රු. 22,619,409 ක් කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

(ඇ) ආයතන 9 ක කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණු රු. 219,410,000 ක් විසර්ජන ගිණුම්වල ජංගම නොවන වත්කම් ලෙස දක්වා නොතිබුණි.

(ඈ) විසර්ජන ගිණුම් අනුව ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන රු. 122,944,163 ක් වූ අයිතම ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ක්ෂය ප්‍රතිපාදන ඇති කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු. 2,474,350 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඌව පළාත් සභාවේ විවිධ ආයතන සතු පුස්තකාල පොත්වල වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ඌව පළාත් සභාවේ ආයතන සතු අස්පෘශ්‍ය වත්කම් සහ තොග වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් ආඥා පනත යටතේ ලැබිය යුතු ආදායම් නිවැරදිව ගණනය කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල රු. 45,806,655 ක් ලෙස දක්වා තිබුණු එම ආදායම් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුම අනුව රු. 12,974,607 ක් වූයෙන් රු. 32,832,048 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 51,583,766 ක් සහ පිරිවැටුම් බදු රු. 44,424,103 ක් ද, පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු මුද්දර ගාස්තු සහ උසාවි දඩ වටිනාකම ද හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් ඌව කළමනාකරණ සංවර්ධන ආයතනයට අයවිය යුතු රු. 160,378 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවියයුතු වියදම් රු. 1,124,549 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු බැවින් වර්ෂයේ වියදම සහ ජංගම බැරකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාල ක්ෂය සංචිත ගිණුම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ කල්බදු පොළිය හඳුනා නොගෙන රු. 76,546,578 ක් වූ කල්බදු වාරික හා පොළිය වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා කල්බදු වාරිකවල වටිනාකම වූ රු. 71,818,216 කින් වර්ෂයේ වියදම වැඩියෙන් දක්වා තිබුණි.

(ක) 2018 වර්ෂය සඳහා ගෙවිය යුතු ශුද්ධ කල්බදු වාරිකවල වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ කල්බදු ණය හිමියන් ලෙස දැක්විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල දළ කල්බදු වටිනාකම හෙළිදරව් කර තිබුණි.

2.2.4 නොසැසඳු පාලන ගිණුම්
--------------------------

(අ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අයිතමයන් 4 ක වටිනාකම් එම ආයතනවල විසර්ජන ගිණුමේ දක්වා තිබුණු වටිනාකම් සමඟ නොසැසඳුනි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ආයතන 03 ක සකස් කරන ලද වාණිජ අත්තිකාරම් ගිණුම්වල ගෙවිය යුතු අත්තිකාරම් ශේෂ සඳහන් නොවූ අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව පියවිය යුතු අත්තිකාරම් ශේෂය රු. 7,769,811 ක් විය.

(ඇ) බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ඖෂධ තොරතුරු පද්ධතිය අනුව ශේෂයන් හා තථ්‍ය ශේෂයන් අතර අයිතම 04 ක් සම්බන්ධයෙන් රු. 159,444 ක ඌනතාවයක් ද, අයිතම 04 ක් සම්බන්ධයෙන් රු. 532,837 ක අතිරික්තතාවයක් ද නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් ඌව පළාතේ පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව රු. 266,263,635 ක් වුවද පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද පළාත් පාලන ආයතනවල හිඟ ආදායම් උපලේඛනය අනුව රු. 238,233,224 ක් වූයෙන් රු. 28,030,411 ක වෙනසක් විය.

2.2.5 අග්‍රිම ගිණුම්
-------------

2017 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් ඇතුළුව ආයතන 16 කට අදාලව පැවැති නොපියවූ අග්‍රිම ශේෂ එකතුව රු. 50,844,567 ක් විය. 2018 මාර්තු 31 දිනට එය රු. 47,446,168 ක් විය.

2.2.6 පොදු තැන්පත් ගිණුම්
------------------------

2017 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව, මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාදනය නොකල ආයතන 23 කට අයත් තැන්පත් ශේෂය රු. 52,465,386 ක් විය. 2018 ජුලි 15 දිනට එම ශේෂය රු. 45,512,383 ක් විය.

2.2.7 පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්
----------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාලවලින් ස්ථාන මාරුවී ගිය, මියගිය හා විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂය රු. 84,472,501 ක් වූ අතර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ කාර්යාල 15 කින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ රු. 34,740,786 ක් වූ ණය ශේෂ නිරවුල් කර නොතිබුණි. 2018 ජුලි 15 දිනට එම ශේෂයන් පිළිවෙළින් රු. 81,990,217 ක් සහ රු. 34,717,843 ක් විය.

(ආ) ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක හා වනිතා කටයුතු හා සමාජ සුභ සාධන අමාත්‍යාංශයේ පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ අවම බැර සීමාවට රු.164,317 කින් ළඟා වී නොතිබුණු අතර උපරිම හර ශේෂ සීමාව රු.280,224 කින් ඉක්මවා තිබුණි.

2.2.8 ලැබිය යුතු ගිණුම්

(අ) බීජ අර්තපල් ගිණුම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 40,405,067 ක් වූ අතර වර්ෂ 11 කට අධික කාලයක් පළාත් සහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් දක්වා තිබුණි. මෙම ශේෂය ණය ගැතියන්ගෙන් මාසිකව අයකර ගතයුතු වුවද, එය ක්‍රමාණුකූලව සිදු වී නොමැති බව පසුගිය වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ අයකර ගැනීම් අනුව නිරීක්ෂණය විය.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැටුප් මුදල් අතුරුදහන් වීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිදුවී ඇති වැටුප් මුදල් වංචාව සඳහා වර්ෂ 11 කට අධික කාලයක් ගතවී ඇති නමුත් 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් නිරවුල් නොවූ ශේෂය රු. 440,990 ක් විය.

2.2.9 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| (I) | XII පරිච්ඡේදය 24.1 වගන්තිය | | බ/ශ්‍රී සංඝබෝධි විද්‍යාලයේ ගුරුභවතුන් 10 දෙනෙකු 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පාසැල් පැවැත්වෙන කාලය තුළදී විවේක නිවාඩු ලබාගෙන තිබුණි. |
| (II) | xxiv පරිච්ඡේදයේ 3.5 වගන්තිය | | බ/සුජාතා මහා විද්‍යාලයේ ගුරු භවතුන් හා වෙනත් නිලධාරින් 7 දෙනෙකු සඳහා මාසික වැටුපෙන් අඩු කිරීම්වල එකතුව සියයට 40 සීමාව ඉක්මවා ණය මුදල් ලබාදී තිබුණි. |
| (ආ) | ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහය | | |
| (I) | රීති 170.2.4 | 869,600 | ඌව පළාතේ පළාත් පාලන ආයතන හා සම්බන්ධ ප්‍රජා මණ්ඩල සාමාජිකයන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට රාජ්‍ය නොවන සංවිධානයකින් ලැබුණු රු. 869,600 ක මුදල සම්බන්ධයෙන් පළාත් භාණ්ඩාගාරයට වාර්තා කර නොතිබුණි. |
| (II) | රීති 371 | 145,000 | බ/සුජාතා මහා විද්‍යාලය විසින් භාණ්ඩ හා සේවා සපයා ගැනීම සඳහා බාහිර පාර්ශවයන් වෙත අවස්ථා 07 කදී අත්තිකාරම් ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (III) | රීති 705 | | වගකීම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනය ප්‍රධාන ලේකම් විසින් පවත්වාගෙන නොතිබුණු අතර මාස 06 කට වරක් එකී විස්තර ගණන්දීමේ නිලධාරින් හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් වෙත දන්වා යවා නොතිබුණි. |
| (IV) | රීති 708.1 | - | ප්‍රසම්පාදන රැස්වීම් අවසාන වූ වහාම කමිටු නිලධාරින් විසින් ප්‍රසම්පාදන කමිටු තීරණයට අදාලව එකඟතාවය හෝ නොඑකඟතාවය පළ කරමින් අත්සන් කළයුතු වුවද, බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කර්යාලයේ ප්‍රසම්පාදන තීරණ 06 කට සහ මහියංගණ මූලික රෝහලේ තීරණ 03 කට කමිටු සාමාජිකයන් විසින් අත්සන් තබා නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>---------------------------- | | |
| (I) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 | 327,000 | රජයේ සේවකයෙකු සඳහා ගෙවිය හැකි සමස්ථ ආපදා ණය ශේෂ සීමාව රු.250,000 ක් වුවද, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වෙත සීමාව ඉක්මවා ආපදා ණය ගෙවා තිබුණි. |
| (II) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 | - | බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සතු වාහන 54 ක්, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව සතු වාහන 07 ක්, සමාජ සේවා දෙපාර්තමේන්තුව සතු වාහන 01 ක් සහ ක්‍රීඩා, යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, ජෙෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය සතු වාහන 13 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය<br>---------------------------- | | |
| (I) | 2.9.2 වගන්තිය | | බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්ගේ සහ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්ගේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| (II) | 4.2 වගන්තිය | | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ මහියංගණය මූලික රෝහල සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |
| (III) | 8.9.1 වගන්තිය | | රු. 250,000 ක් ඉක්මවන වැඩ කොන්ත්‍රාත් සඳහා ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු වුවද සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් වාහන 03 ක් අළුත්වැඩියා කිරීමට විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. |

(ඉ) වෙනත් චක්‍රලේඛ

------------------

| | | |
|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2013 නොවැම්බර් 28 දිනැති අංක 7/2013 දරන චක්‍රලේඛය | - | බදුල්ල අධ්‍යාපන කලාපයේ පාසැල් 108 ක් විසින් 2017 වර්ෂය සඳහා ක්‍රමාණුකූලව පාසැල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ සිව්මස් ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

3. ආදායම් කළමනාකරණය

---------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා වලට පැවරී ඇති ආදායම් විෂයයන් 13 ක් සම්බන්ධයෙන් ඌව පළාත් සභාවේ ප්‍රඥප්ති සම්මත කරගෙන නොතිබුණු අතර ආදායම් විෂයයන් 6 ක් 2017 වර්ෂයේ මුදල් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ මු.රී. 82 ප්‍රකාරව ඌව පළාත් සභාවේ ආදායම් විෂයයන් සම්බන්ධයෙන් ආදායම් ගණන්දීමේ නිලධාරින් පත්කර නොතිබුණු අතර මු.රී. 142.1 ප්‍රකාරව තක්සේරු කළයුතු ආදායම් හඳුනාගෙන 2017 වර්ෂය සඳහා ආදායම් තක්සේරු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබුණු ආදායම් විෂයයන් 21 ක ඇස්තමේන්තුගත ආදායම දක්වා නොතිබුණි.

(ඈ) ඌව පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරන විවිධ කාර්යයන් වෙනුවෙන් අයකළ හැකි ආදායම් අවස්ථා 04 ක් ප්‍රවර්ධනය කිරීම සඳහා නිශ්චිත ක්‍රියාපටිපාටි ස්ථාපිත කර නොතිබුණි.

(ඉ) 1990 අංක 08 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ 37 වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ පිහිටි නිශ්චල දේපළ පැවරීමකට අදාළ සාධනපත්‍ර සඳහා අයකරනු ලබන මුද්දර ගාස්තු සඳහා පළාත් ආදායම් කොමසාරිස් විසින් තක්සේරු කර අතිරේක මුද්දර ගාස්තු අය කිරීමේදී යලි තක්සේරු සඳහා සුදුසුකම්ලත් වෘත්තීමය තක්සේරු ලබා ගෙන නොතිබුණි.

(ඊ) 1990 අංක 08 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ 104(අ) වගන්තිය ප්‍රකාරව පළාත් ආදායම් දිරිගැන්වීමේ අරමුදලක් පිහිටුවිය යුතු වුවද, ප්‍රඥප්තියක් සම්මත කර අරමුදල පිහිටුවීමෙන් තොරව 2010,2011,2015 සහ 2016 වර්ෂ වලදී පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට රු. 11,490,063 ක දිරි දීමනා ගෙවා තිබුණි.

(උ) කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පේෂකර්ම ණයට විකුණුම් මුදල් සමාන වාරික 08 කින් අයවිය යුතු වුවද, 2017 අගෝස්තු 31 දිනට හිඟහිටි ණයට විකුණුම් වටිනාකම රු.2,842,145 ක් විය. ඉන් රු.2,255,811 ක් හෙවත් සියයට 80 ක ප්‍රමාණයක් වසර 10 කට වැඩි කාලයක් ඉක්මවා තිබුණි.

4. මූල්‍ය සමාලෝචනය

4.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 207,181,480 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 660,587,282 ක් විය.

4.2 ආදායම හා වියදම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2017 | | | 2016 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම් | | | | | | |
| බදු ආදායම | 3,068,195,000 | 2,925,591,682 | (142,603,318) | 2,232,715,000 | 2,616,124,142 | 383,409,142 |
| බදු නොවන ආදායම | 371,805,000 | 561,658,971 | 189,853,971 | 452,285,000 | 680,585,806 | 228,300,806 |
| රජයේ ප්‍රදාන | 18,820,751,000 | 19,456,886,980 | 636,135,980 | 20,294,797,000 | 18,587,838,770 | 1,706,958,230 |
| එකතුව | 22,260,751,000 | 22,944,137,633 | 683,386,633 | 22,979,797,000 | 21,884,548,718 | 2,318,668,178 |

| | 2017 | | | 2016 | | |
|---|---|---|---|---|---|---|
| | **අයවැයගත** | **තථ්‍ය** | **විචලනය** | **අයවැයගත** | **තථ්‍ය** | **විචලනය** |
| | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 15,196,717,000 | 16,505,876,088 | (1,309,159,088) | 15,094,448,000 | 15,952,243,721 | (857,795,721) |
| අනෙකුත් පුනරාවර්තන | 4,141,994,000 | 3,563,043,189 | 578,950,811 | 3,840,389,000 | 3,433,634,055 | 406,754,945 |
| **උප එකතුව** | **19,338,711,000** | **20,068,919,277** | **(730,208,277)** | **18,934,837,000** | **19,385,877,776** | **(451,040,776)** |
| රාජ්‍ය ආයෝජන | 2,993,750,000 | 3,390,850,109 | (397,100,109) | 3,569,960,000 | 2,998,153,309 | 571,806,691 |
| **එකතුව** | **22,332,461,000** | **23,459,769,386** | **1,127,308,386** | **22,504,797,000** | **22,384,031,085** | **120,765,915** |

වර්ෂයේ මුළු ආදායම රු. 22,944,137,633 ක් වූ අතර ඉන් රු. 19,456,886,980 ක් රජයේ ප්‍රදාන විය. බදු ආදායම රු. 2,925,591,682 ක් හෙවත් මුළු ආදායමෙන් සියයට 13 ක් ද, බදු නොවන ආදායම රු. 561,658,971 ක් හෙවත් මුළු ආදායමෙන් සියයට 2 ක්ද වී තිබුණි. වර්ෂයේ මුළු ආදායම වූ රු. 22,944,137,633 න් පුනරාවර්තන වියදම් සඳහා රු. 20,068,919,277 ක් හෙවත් සියයට 85 ක්ද රජයේ ආයෝජන සඳහා රු. 3,390,850,109 ක් හෙවත් සියයට 15 ක්ද උපයෝජනය කර තිබුණි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා වලට පැවරී ඇති ආදායම් විෂයයන් වලින් ප්‍රමාණවත් ආදායමක් රැස්කර නොතිබුණි.

5. නෛතික සිද්ධීන්
-------------------
ඌව පළාත් සභාවට එරෙහිව පවරා ඇති හඳුනාගත් නඩු කටයුතු 4 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

6. අරමුදල් හා වාණිජ අත්තිකාරම් ගිණුම්
-----------------------------------------
6.1 අරමුදල් ගිණුම්
-----------------
6.1.1 ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදල
---------------------------------------
කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------
සමාලෝචිත වර්ෂයේ වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් ප්‍රධාන අමාත්‍ය අරමුදලට වෙන්කළ ප්‍රතිපාදනය රු. 10,000,000 ක් වූ අතර අමතර ප්‍රතිපාදන සලසා ගැනීම, ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 72 ක් වී තිබුණි. වර්ෂය අවසානයේ ඉතිරි ප්‍රතිපාදනය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක ප්‍රමාණයක් විය. වර්ෂය ආරම්භයේදී විධිමත් සැලැස්මකට අනුව 1993 අංක 2 දරන ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදල් ප්‍රඥප්තියේ සඳහන් අරමුණු කෙරෙහි යොමු වී නොමැති බවද, ප්‍රතිලාභීන් තෝරාගැනීමට විධිමත් ක්‍රමවේදයක් නොමැති බවද, මුදල් ප්‍රකාශනයේ ප්‍රතිපාදන වෙන්කිරීමේදී පූර්ව සැලැස්මකට අනුව අවශ්‍යතා හඳුනා ගෙන නොමැති බවද නිරීක්ෂණය විය.

6.1.2 ඌව නවෝදය අරමුදල
------------------------
කාර්ය සාධනය
-----------------
1992 අංක 01 දරන ඌව නවෝදය අරමුදල් ප්‍රඥප්තියේ (6) වන වගන්තියේ සඳහන් පහත දැක්වෙන පොදු පරමාර්ථ ඉටුකර ගැනීමකින් තොරව එකතුව රු. 27,474,518 ක් 2017 දෙසැම්බර් 31 දිනට මහජන බැංකුවේ වැලිමඩ හා බදුල්ල ශාඛාවල ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි.

(i) විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල හෝ ඒ හා සමාන වෙනත් අධ්‍යාපන ආයතන වල උසස් අධ්‍යාපනය ලබන්නා වූ පළාතේ ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවයන් සඳහා මූල්‍ය ආධාර සලසාදීම.

(ii) ක්‍රීඩා දක්ෂතා දක්වන සිසුන්ගේ ක්‍රීඩා නිපුනත්වය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ආධාර හා ශිෂ්‍යත්ව පිරිනැමීම.

6.1.3 ඌව ව්‍යවසාය සංවර්ධන අරමුදල

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) නොසැසඳීම්

සමාලෝචිත වර්ෂය තුළ "ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - ණයගැති" ගිණුමට හරකරන ලද රු. 9,250,000 ක් දෙසැම්බර් 31 දිනට එම බැංකුවේ ණය වාර්තාව අනුව රු. 8,200,000 ක් වූයෙන් රු. 1,050,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ලැබිය යුතු ගිණුම්

හිඟහිටි කාලය වර්ෂ 08 ක් වූ රු. 129,101 ක් වටිනා යතුරු පැදි ණය මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ඇ) නීති,රීතී, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහය 133.3 හා 133.4 | අරමුදලේ ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. |
| (ආ) | 2000 අංක 01 දරන ඌව ව්‍යවසායකත්ව සංවර්ධන අරමුදල් ප්‍රඥප්තිය 34 ජේදය | අවම වශයෙන් වසරකට දෙවරක්වත් රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී එක් වරක් පමණක් රැස්වීම් පවත්වා තිබුණි. |

(ඈ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

(i) 2000 අංක 01 දරන ඌව ව්‍යවසාය සංවර්ධන අරමුදල් ප්‍රඥප්තියේ 8(9) වගන්තිය ප්‍රකාරව අරමුදලට වාසිදායක වන ලෙස යෝග්‍ය සහ අවශ්‍ය බැංකු තෝරා ගෙන ගිණුම් විවෘත කලයුතු වුවත් ‘‘ඌව පළාත් සභා ව්‍යවසාය සංවර්ධන ණය යෝජනා ක්‍රමය’’ ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය වෙළඳපලේ පවතින ප්‍රතිණය පහසුකම් සපයන ණය ආයතනවලින් ණය යෝජනා ක්‍රම පිළිබඳ වාර්තා ලබාගෙන ඇගයීම් කර ණය දීමේ හැකියාව තීරණය කිරීමෙන් තොරව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගෙන තිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට ඌව ව්‍යවසාය සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව ඌව ව්‍යවසාය සංවර්ධන ණය යෝජනා ක්‍රමය මගින් රු. 9,250,000 ක ණය මුදල් ප්‍රදානය කර තිබුණද, ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටි පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(iii) සී/ස බදුල්ල දිස්ත්‍රික් සණස සමිති සංගමයේ 2001 මැයි 23 දින ආරම්භ කරන ලද අංක 856 දරන ගිණුමෙහි 2017 දෙසැම්බර් 31 දින වන විට රු.1,235,354 ක් සහ 2016 ඔක්තෝබර් 17 දින ආරම්භ කරන ලද අංක 1466 දරන ගිණුමෙහි 2017 දෙසැම්බර් 31 දින වන විට රු.263,348 ක මුදලක් අක්‍රීය ලෙස ශේෂව පැවති අතර එම මුදල් අරමුදලේ පොදු ගිණුමකට බැර කර නොතිබුණි.

6.1.4 සමුපකාර සංවර්ධන අරමුදල
------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 29 වන දින සී/ස හාලිඇල විවිධ සේවා සමුපකාර සමිතියට රු.2,000,000 ක මුදලක් ලබාදී තිබුණද කිසිදු වාරිකයක් අයකර ගෙන නොතිබුණු අතර කළමනාකරණය විසින් ණය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමුපකාර සංවර්ධන අරමුදලේ වටිනාකමට අනුව නිරායාසයෙන්ම ලැබෙන අරමුදල් වලට අතිරේකව සමුපකාර වෙළඳ ප්‍රදර්ශන, ලොතරැයි සැණකෙළි ආදිය සංවිධානය තුළින් සහ දේශීය හා විදේශීය පරිත්‍යාග තුළින් අරමුදල ප්‍රවර්ධනය කිරීම සඳහා පාලක මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි සමුපකාර සමිති ගණන 1434 ක් වුවද ඉන් 673 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ඈ) 2011 අංක 03 දරන ඌව පළාත් සභා සමුපකාර ප්‍රඥප්තියට අදාල රීති මාලාවේ, රීති 43(ii) හි විධිවිධාන අනුව හා එකී ව්‍යවස්ථාවේ 04 වන වගන්තිය ප්‍රකාරව අරමුදලට ලැබිය යුතු රු.88,523,647 ක හිඟ දායක මුදල් ශේෂයක් 2017 දෙසැම්බර් 31 දින වනවිට පැවති අතර ලියාපදිංචි සමිති 1434 න් සමිති 1354 ක් සමාලෝචිත වර්ෂයට දායක මුදල් ගෙවා නොතිබුණි.

6.1.5 ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය
------------------------------------------------------

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------
වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කර ආදායම් මුදල් පදනම මත මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති 2 ක් භාවිතා කර තිබුණි.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා
--------------------------------
ඌව පළාත ඇතුලත මගී ප්‍රවාහන සේවාවන්ද, ඌව පළාතට අදාල වන ප්‍රමාණයට ඌව පළාත හා සම්බන්ධවන අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවාවන්ද විධිමත් කිරීම හා එම කාර්යයට ආනුෂංගික වන අනෙකුත් කාර්යයන් සඳහාද, එකී විධිමත් කිරීමේ

අරමුණ ඉටුකර ගැනීම උදෙසා ඌව පළාතට මගී ප්‍රවාහන සේවා අධිකාරිය ස්ථාපනය කිරීම සඳහා වන ඌව පළාත් සභාවේ 2001 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය සඳහා වූ රෙගුලාසි පිළියෙල කර නොතිබුණි.

(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

ප්‍රවාහන අධිකාරිය මගින් නව මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කර නොතිබුණි.

**(ඈ)** ආදායම් පරිපාලනය

---------------------

2017 දෙසැම්බර් 31 දිනට බස්රථ 1146 ක් සඳහා මාර්ග බලපත්‍ර නිකුත් කර තිබුණු අතර ඉන් බස්රථ 446 ක් පමණ ධාවනය නොවන බව අනාවරණය විය. බස්රථ වල මාර්ග බලපත්‍ර අළුත්කිරීම්, මාසික ලොග්පත්‍ර ආදායම් සහ රියදුරු කොන්දොස්තර බලපත්‍ර ගාස්තු යාවත්කාලීන කර ආදායම් සහ හිඟ ආදායම් හඳුනාගත හැකි පරිදි ආදායම් ලේඛන නඩත්තු කර නොතිබුණි.

6.1.6 ඌව පළාත් නිවාස සංවර්ධන චක්‍රීය ගිණුම

--------------------------------------------------

2010 අංක 06 දරන ඌව පළාත් නිවාස සංවර්ධන ප්‍රඥප්තියේ දැක්වෙන කාර්යයන් 12 ක් ඉටුකර ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

6.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

--------------------------

6.2.1 පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය සඳහා වූ අත්තිකාරම් ගිණුම - විෂය අංක 72602

----------------------------------------------------------------------------------------------------

**(අ)** අත්තිකාරම් ගිණුම් සීමාවන් පිළිනොපැදීම

------------------------------------------

2017 වාර්ෂික මුදල් ප්‍රකාශය අනුව අත්තිකාරම් ගිණුමේ උපරිම හර ශේෂ සීමාව රු. 37,000,000 ක් වුවද, දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම අනුව ණයගැතියන් රු. 52,516,923 ක් වීමෙන් උපරිම හර ශේෂ සීමාව රු. 15,516,923 කින් ඉක්මවා තිබුණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

---------------------

ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයේදී වාහන, යන්ත්‍රෝපකරණ සවි කිරීම් සහ ආවුද අයිතම 07 ක පොත් අගයට වඩා අඩු වූ ප්‍රත්‍යාගණන වටිනාකම්වල එකතුව රු. 6,071,839 ක් වත්කම් ගිණුම් බැරකර ප්‍රත්‍යාගණන ගිණුමට හරකල යුතු වුවද, වාහන, යන්ත්‍රෝපකරණ සවි කිරීම් සහ ආවුද ඉවත් කිරීමේ ගිණුම් වලට හර කර තිබුණි. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වලට අදාල ක්ෂය වටිනාකම වූ රු.7,020,894 ක් ප්‍රත්‍යාගණන ගිණුමට බැර කිරීම වෙනුවට ඉවත්කිරීමේ ගිණුමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 949,055 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **උඩව පළාත් සභා මුදල් රීති සංග්‍රහය** | | |
| මු.රී. 504.1 | - | 2017 වර්ෂයේ එක් එක් කාර්තු සඳහා වෙළඳ ණය ගැතියන්, වෙළඳ ණය හිමියන් සහ අත්තිකාරම් ගිණුම් සඳහා නියමිත සීමාවන් පිළිබඳ ප්‍රකාශ පිළියෙල කර විගණකාධිපතිට පිටපත් සහිතව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| මු.රී. 507.2.4 | 99,560,108 | සත්‍යාපනයෙන් පසු අනාවරණය වන තොග සහ ස්ථාවර වත්කම් වල වටිනාකමේ ප්‍රමාණාත්මක විෂමතා සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියා විසින් ක්‍රියාකර නොතිබුණි. |
| මු.රී. 509.1 | 10,711,600 | 2017 වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය පළාත් භාණ්ඩාගාරයේ පොත් පියවීමට මත්තෙන් ක්ෂය සංචිත අරමුදලට බැර කිරීම පිණිස පළාත් භාණ්ඩාගාරයට යවා නොතිබුණි. |

(ඈ) කළමනාකරණ අකාර්යක්ෂමතා

(i) 2008 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල සේවාවන් සැපයීම වෙනුවෙන් අයවිය යුතු රු. 52,516,432 ක ශේෂයෙන් 2018 මැයි 23 දින වන විට රු. 30,243,811 ක් තවදුරටත් අයවීමට තිබුණි.

(ii) තොග පොත් අංක 42 හි සටහන්ව ඇති වටිනාකම රු. 16,000 ක් වූ 185×14 ප්‍රමාණයේ ටයර් දෙකක් අස්ථානගත වී තිබුණු අතර, මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට සහ පාඩුව පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2013 වර්ෂයේදී රු. 4,540,052 ක් වැයකර ඉදිකරන ලද මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටි නක්කල සේවා ස්ථානය වාහන සේවා කිරීම් කටයුතු සඳහා භාවිතා නොකර නිශ්කාර්යව පැවති අතර සමාලෝචිත වර්ෂයේදී සේවා මධ්‍යස්ථානය වෙනුවෙන් දරන ලද මුළු වියදම රු. 970,943 ක් වී තිබුණි.

6.2.2 ඌව පළාත් මුද්‍රණාලයේ අත්තිකාරම් ගිණුම
-----------------------------------------------

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

(i) ඌව පළාත් මුදල් රීති 504.1 ප්‍රකාරව එක් එක් කාර්තුව අවසානයේ අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාලව පිළියෙල කළයුතු වෙළඳ ණය හිමියන් පිළිබඳ ප්‍රකාශය සහ අමුද්‍රව්‍ය ගබඩා භාණ්ඩ හා සැපයුම් පිළිබඳ ප්‍රකාශය පිළියෙල කර එම කාර්තුවට පසුව එළඹෙන ප්‍රථම මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ඌව පළාත් මුදල් රීති 504.2 ප්‍රකාරව එක් එක් කාර්තුව අවසානයේදී අවස්ථානුරූප ලාභාලාභ ගිණුමක් පිළියෙල කර නොතිබුණි.

(iii) ඌව පළාත් මුදල් රීති 501.3 ප්‍රකාරව වාණිජ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් සීමාවන් 04 ක් දැක්විය යුතු වුවද, ඌව පළාත් මුද්‍රණාල අත්තිකාරම් ගිණුමෙහි බැරකම්වල උපරිම සීමාව දක්වා නොතිබුණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

(i) මුද්‍රණාලය පිහිටි ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

(ii) මුද්‍රණාලය සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ලේ මුළු නිමි වැඩ වටිනාකම හඳුනා ගැනීමකින් තොරව රු.11,893,914 ක් පමණක් වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම
-----------------------------------------------------------------------

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| ඌව පළාත් මුදල් රීති | | |
| මු.රී.156(5) | - | ගිණුම්වල හා ඒ සම්බන්ධ ලියවිලිවල මකා දැමීම් සිදුකර තිබුණු නමුත් නිවැරදි කිරීම් සඳහා වගකිව යුතු නිලධාරින් කෙටිසන් යොදා නොතිබුණි. |
| මු.රී. 505 | - | අත්තිකාරම් ගිණුම් කටයුත්ත සම්බන්ධයෙන් මාසික සෝදිසි පරීක්ෂණ සිදුකර නොතිබුණි. |
| මු.රී. 509.1 | 378,455 | අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාල වත්කම් ක්ෂය කර පළාත් භාණ්ඩාගාරයේ පොත් පියවීමට මත්තෙන් ක්ෂය සංචිත ගිණුමට බැර කිරීම පිණිස පළාත් භාණ්ඩාගාරය වෙත යවා නොතිබුණි. |

(ඈ) නොසැසඳීම්

-------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවල වටිනාකම රු. 7,670,753 ක් වුවද, මුදල් පොත හා ඉතිරි කිරීමේ ගිණුමෙහි ශේෂයන්වල එකතුව රු. 4,529,854 ක් වූයෙන් රු. 3,140,899 ක වෙනසක් විය.

(ඉ) කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

(i) දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පවතින රු. 274,016 ක් වූ ණයගැති ශේෂ 11 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් හා චෙක්පත් ලැබීම් ජංගම ගිණුමට තැන්පත් කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මස සිට දෙසැම්බර් දක්වා වූ ලැබීම් රු. 3,947,508 ක් ඉතිරි කිරීමේ ගිණුමට තැන්පත් කර නැවත ජංගම ගිණුමට මාරු කර තිබුණි.

(ඊ) කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අවශ්‍ය කාර්ය මණ්ඩලය නිර්ණය කර අනුමත කර ගෙන නොතිබුණි.

6.2.3 විෂය අංක 71502 - බොරලන්ද සත්ව ගොවිපල වාණිජ අත්තිකාරම් ගිණුම

---------------------------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ) තොග අගය කිරීම්**

-------------------

ගොවිපල අවසන් ජීව තොග අගය කිරීමේදී සත්ව තොග ජීව බර අනුව අගය කරන බව සටහන් මගින් හෙළිදරව් කර තිබුණද වර්ෂය තුළ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබුණු ආනයනික සතුන් 100 කගේ ආනයනික පිරිවැය රු.48,000,000 ක් තොග වටිනාකම ලෙස ගිණුම්ගත කර තිබුණි.

**(ආ)** නීති, රීතී, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

පළාත් මු. රී. 509.1 අනුව වත්කම් ක්ෂය කර ඊට අදාල රු.1,978,569 ක මුදල සංචිත ක්ෂය ලෙස පළාත් භාණ්ඩාගාරයේ 'පොදු තැන්පත් ගිණුම - ක්ෂය සංචිත අරමුදල' ගිණුමට බැර කිරීම පිණිස පළාත් භාණ්ඩාගාරයට යවා නොතිබුණි.

(ඇ) මූල්‍ය සමාලෝචනය

----------------------

සීමා නොපිළිපැදීම

--------------------

2017 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුව අනුව බැරකම්වල උපරිම සීමාව අනුමත කර නොතිබියදී, දෙසැම්බර් 31 දිනට රු.1,018,758 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි.

(ඈ) බලය නොලත් කාරක පාඩු

-----------------------------

2015 වර්ෂයේ අත්තිකාරම් ගිණුමේ රු.10,571,904 ක කාරක පාඩුවක් සිදුව තිබුණු අතර, පළාත් මුල්‍ය රීති 512.2 ප්‍රකාරව කටයුතු කර ප්‍රතිපාදන වෙන්කර ගෙන අලාභය

කපා හැර නොතිබුණි. එම කාරක පාඩුව සමුච්චිත ලාභයට හර කිරීමෙන් බලය නොලත් කාරක පාඩුව මූල්‍ය ප්‍රකාශන තුළින් පිළිබිඹු නොවීය.

(ඉ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

(i) සමාලෝචිත වර්ෂය සඳහා අත්තිකාරම් ගිණුම් කටයුත්තේ පාඩුව රු.3,615,345 ක් වූ අතර එය පසුගිය වසරේ ලාභය වූ රු.2,402,937 ක් හා සැසඳීමේදී රු.6,018,282 ක පිරිහීමක් විය. සමාලෝචිත වර්ෂයේ කල්පිත ගාස්තු ගැලපීමෙන් පසු ශුද්ධ අලාභය රු.12,184,447 ක් වී තිබුණි.

(ii) බොරලන්ද සත්ව ගොවිපලට 2017 දෙසැම්බර් මාසයේදී ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කල උසස් තත්ත්වයේ ගවදෙනුන් 100 ක් වෙනුවෙන් ගව ගාලක් ඉදිකිරීම සඳහා 2017 නොවැම්බර් 06 දින ගිවිසුම් අත්සන් කර තිබුණු අතර ගව ගාල ඉදිකිරීම් 2018 පෙබරවාරි 03 දින නිම කළයුතුව තිබුණි. 2018 මාර්තු 23 දින දක්වා අදාල ඉදිකිරීම නිම කර නොතිබුණු අතර ගව දෙනුන් සෞඛ්‍ය ආරක්ෂිත නොවන ආකාරයෙන් ගාල් කර තිබුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට රු.5,977,306 ක මුදල් අතිරික්තයක් ඉතිරි කිරීමේ ගිණුමක රඳවාගෙන තිබුණි.

7. මෙහෙයුම් සමාලෝචනය

7.1 කාර්යසාධනය

7.1.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදන සහ ඒවා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අරමුදල් ප්‍රභවය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිවීම් | ඉතිරිවීම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| උපමාන පාදක ප්‍රදාන | 616,336,640 | 494,934,406 | 121,402,234 | 20 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 3,380,174,540 | 2,415,804,380 | 964,370,161 | 28 |
| ලෝක බැංකු ආධාර | 711,417,635 | 476,084,323 | 235,333,312 | 33 |
| යුනිසෙෆ් | 4,027,632 | 4,027,001 | 631 | .01 |
| එකතුව | 4,711,956,447 | 3,390,850,110 | 1,321,106,339 | |

7.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 2186.6 ක ඇස්තමේන්තු අගයකට වූ ව්‍යාපෘති යෝජනා 3076 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘති වැඩ යෝජනාවල ප්‍රගතිය පහත දැක්වේ.

| ව්‍යාපෘති විස්තර | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා |
|---|---|---|---|
| ------------------ | --------- | -------------- | ---------- |
| සම්පූර්ණයෙන් නිමකළ | 2746 | 78 | 2824 |
| 50% ට වඩා වැඩියෙන් නිමකළ | 162 | 25 | 187 |
| 50% ට වඩා අඩුවෙන් නිමකළ | 17 | 03 | 20 |
| ආරම්භකර නොතිබූ | 36 | - | 36 |
| මතභේදකාරී/ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | 08 | 01 | 09 |
| | ------- | ------- | ------- |
| එකතුව | 2969 | 107 | 3076 |
| | ==== | ==== | ==== |

7.1.3 තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

(අ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුය. සමාලෝචිත වර්ෂයට අදාළව ඌව පළාත් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද, තම කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද, ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා 2016, 2017 සහ 2018 වර්ෂවලදී ලද මූල්‍ය ප්‍රතිපාදන වටිනාකම සහ තථ්‍ය වියදම් හඳුනාගෙන නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණයක් පවත්වා නොගැනීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළඟාවීමට, සැලසුම් සකස් කිරීමේදී හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවැති බව නිරීක්ෂණය විය.

7.1.4 වෙනත් නිරීක්ෂණ

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) බ/සුජාතා මහා විද්‍යාලය විසින් 2017 වර්ෂය සඳහා පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි දැක්වෙන කාර්යයන් 12 ක් ඉටුකර නොතිබුණි.

(ආ) බ/සුජාතා මහා විද්‍යාලයේ 2014 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී ඉංග්‍රීසි විෂය සමත්වීමේ ප්‍රතිශතය සියයට 6 කින් සහ ගණිතය විෂය සමත් වීමේ ප්‍රතිශතය සියයට 7 කින් පහත වැටී තිබුණි.

(ඇ) බ/ ශ්‍රී සංඝබෝධි විද්‍යාලයේ 2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මෙහි දැක්වෙන පාසැල විසින් සපුරාගත යුතු ප්‍රධාන අරමුණු 08 කින් අරමුණු 05 ක් ඉටුකරගෙන නොතිබුණි.

(ඇ) බ/ ශ්‍රී සංඝබෝධි විද්‍යාලයේ 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනීසිටි සිසුන්ගෙන් ඉංග්‍රීසි විෂයය සමත්වීමේ ප්‍රතිශතය සියයට 10 සිට සියයට 26 දක්වා පරාසයක ද ගණිතය විෂයය සමත්වීමේ ප්‍රතිශතය සියයට 33 සිට සියයට 62 දක්වා පරාසයක ද විය.

(ඉ) ඌව පළාත් සභාවේ වාර්ෂික මුදල් ප්‍රකාශය අනුව ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන කාර්යයන් වන ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ජනාවාස යෝජනා ක්‍රම සැලසුම් කිරීම ,ක්‍රියාත්මක කිරීම සහ ජනාවාස ව්‍යාපාරයන්හි යටිතල පහසුකම් සැපයීම් හා සංවර්ධනය යන ක්‍රියාකාරකම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඊ) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාව අනුව වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණු ජල රක්ෂිත සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘති 6 ක්, පරිසර සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් හා ජල පෝෂක ප්‍රදේශවල රුක් රෝපන වැඩසටහනක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(උ) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක පරිගණකගත ඉඩම් දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි.

(ඌ) මුදල් කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව උපමාන පාදක සංවර්ධන ප්‍රදාන පහත සඳහන් නිර්ණායක යටතේ සීමා කළ යුතුය.

| නිර්ණායකය | ඉටුකළ යුතු ප්‍රතිශතය |
|---|---|
| ආර්ථික යටිතල පහසුකම් | 30 |
| සමාජ යටිතල පහසුකම් | 30 |
| ස්වයං රැකියා ප්‍රවර්ධන | 20 |
| වාරිමාර්ග හා කෘෂිකර්ම | 10 |
| ආගමික සංස්කෘතික හා කලා කටයුතු | 10 |

බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කරනලද ව්‍යාපෘති ප්‍රමාණය, අනුමත මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් කොපමණ ප්‍රතිශතයක් ද යන්න පිළිබඳ වාර්තා පවත්වාගෙන නොතිබුණි. එකී නිර්නායකයන් යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභී ආර්ථික දායකත්වය වාර්තා කර නොතිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාත්මක කර නොතිබුණි.

(එ ) උපමාන පාදක සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන වන ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතුරින් හල්දුම්මුල්ල, මහියංගණය, බුත්තල, මොනරාගල සහ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියැදි පරීක්ෂාවේ දී පහත සඳහන් පොදු අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල නොකිරීම.

(ii) විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකිරීම.

(iii) අපේක්ෂිත කාල රාමුවක් අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම.

(iv) විවිධ ව්‍යාපෘති යටතේ එකම ප්‍රතිලාභියකු වෙත නැවත නැවතත් ප්‍රතිලාභ ලැබීම් වැලැක්වීමේ ක්‍රියාමාර්ග නොගැනීම.

(v) ප්‍රමාණවත් පසු විපරම් ක්‍රියාත්මක නොවීම.

(vi) ද්‍රව්‍ය හා උපකරණ භාර ගැනීම හා බෙදා හැරීම ගබඩා පාලනයෙන් බැහැරව සිදුවීම.

(vii) බෙදාහැරීමේ ලේඛනවල ද්‍රව්‍ය වල අනුක්‍රමික අංක, මාදිලිය, නිෂ්පාදිත වෙළඳ නාම සඳහන් නොවීම.

(viii) උපකරණ සඳහා වගකීම් සහතික ලබා නොගැනීම.

(ix) ඉන්වොයිස් පත්වල ප්‍රමාණවත් විස්තර සඳහන් නොවීම.

(x) ස්වයං රැකියා ආධාර ඌන උපයෝජිතව පැවතීම.

(ඒ) 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයට පටහැනිව උපමාන 2 ක් යටතේ වැය කළහැකි උපරිම සීමාව ඉක්මවා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්) විසින් 2016 වර්ෂයේ දී රු. 169,744,529 ක් උපමාන පාදක ප්‍රතිපාදන වැය කර තිබුණි.

(ඔ) උපමාන පාදක ප්‍රදාන යටතේ සමාජ යටිතල පහසුකම් සඳහා නිවාස ඉදිකිරීමට බෙදාදෙන ලද ද්‍රව්‍යාධාර එම කාර්යය සඳහාම යොදාගත් බව තහවුරු කර ගැනීමේ පසු විපරම් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ද්‍රව්‍ය අදාල කාර්යය සඳහා යොදා නොගත් අවස්ථා 5 ක් මහියංගණය සහ පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව සිදුකරන ලද පරීක්ෂණවලදී අනාවරණය විය. සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෙර පාසල් සඳහා බෙදාහැරීමට 2016 ඔක්තෝබර් 12 දින රු. 197,250 කට මිලදී ගන්නා ලද ජල පෙරන 25 ක් 2017 අගෝස්තු 28 දින වන විටත් ගබඩාවේ රඳවාගෙන තිබුණි. ස්වයං රැකියා ප්‍රවර්ධනය සඳහා උපමාන පාදක ප්‍රතිපාදන යටතේ ඌව පළාත් සභාව විසින් රු. 19,913,408 ක් වැය කර තිබුණු අතර ප්‍රතිලාභීන් ස්වයං රැකියාවල නිරත වන බව පසු විපරම් මගින් තහවුරු කරගෙන නොතිබුණි.

(ඕ) 2017 වර්ෂය සඳහා ඌව පළාත් සභාවේ කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනාගෙන පුහුණු සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ක) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය සඳහා විෂයය අංක 1409 යටතේ පුහුණුව හා සංවර්ධනය වෙනුවෙන් 2017 වර්ෂය තුළ රු. 8,500,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. එම ප්‍රතිපාදනයෙන් 2017 ඔක්තෝබර් 31 දින වන විට රු. 7,882,094 ක් වැය කර තිබුණු අතර එයින් ඌව කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය පවත්වාගෙන යාම සඳහා රු. 5,244,912 ක් වැය කර තිබුණි. පුහුණු වැඩ සටහන් පැවැත්වීම සඳහා වැය කරන ලද මුදල රු. 2,637,132 ක් විය. එය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් වී තිබුණි.

(ග) මොනරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මගින් විවිධ වැඩසටහන් යටතේ බෙදාදුන් බීජ, පැල හා උපකරණ අදාල වැඩසටහන්වල අරමුණ ඉටුවන අයුරින් යොදවා තිබේ ද යන්න පිළිබඳව පසුවිපරම් කර නොතිබුණු අතර ප්‍රතිලාභීන් වෙත නොමිලේ සහ සියයට 50 දායකත්වය යටතේ ලබාදෙන භාණ්ඩ, උපකරණ හා

පැල අපේක්ෂිත කාලය තුළ නොලැබීම නිසා එමගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේ හැකියාව දුර්වල වී තිබුණි.

(ච) පෝෂණ ඌනතා ඇති දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා සාමාන්‍ය ආහාර වේලකින් ලබාගැනීමට අපහසු පෝෂණ අවශ්‍යතා සපුරාලීම ත්‍රිපෝෂ ලබාදීමේ මූලික අරමුණ වන අතර සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අංක 01-07/2016 දරන 2016 ජනවාරි 19 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රතිලාභියකුට දිනකට ග්‍රෑම් 50 බැගින් මාස් පතා, ග්‍රෑම් 1500 ක් (පැකට් 2 ක්) ලබාදිය යුතු වුවද සියඹලාණ්ඩුව ගොවිදුපුර පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාසයේ 2017 වර්ෂය තුළ මාස 8 ක් පමණක් ත්‍රිපෝෂ ලබාදී තිබුණි. ප්‍රතිලාභීන්ට මාසිකව ත්‍රිපෝෂ ලබාදී නොතිබුණ බැවින් මෙම වැඩසටහනේ මූලික අරමුණ ඉටුවී නොතිබුණි.

(ට) සියඹලාණ්ඩුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් මාතෘ සායන 21 ක් පවත්වා තිබුණද ඒ සඳහා භාවිතා කරන Ferrous Sulfate හා Urging Strips නියමිත වේලාවට ලැබී නොතිබුණි. ඒ අනුව මාතෘ සායන පැවැත්වීම ඵලදායි වී නොතිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂය තුළ ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සුනඛ වන්ද්‍යාකරණ වැඩසටහන වෙනුවෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙන් සුනඛයින් 20482 ක් වන්ද්‍යාකරණය කිරීම සඳහා රු.21,630,200 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට සුනඛයින් 7365 දෙනෙකු පමණක් වන්ද්‍යාකරණය කර තිබීම නිසා වැඩසටහනෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ණ) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාකාරකම් 321 ක් සඳහා රු. 166,901,008 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර එයින් ක්‍රියාකාරකම් 29 ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදනය වූ රු. 21,076,000 ක් උපයෝජනය කර නොතිබුණි.

7.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් 30 දින දක්වා කාලය තුළ සභා ලේකම් කාර්යාලයට ටයර් මිලදී ගැනීම සඳහා රු. 422,800 ක් වැය කර තිබුණි. ටයර් සඳහා මිලගණන් කැඳවීමේදී පිරිවිතර ඉතා පටු ලෙස දක්වා තිබුණු අතර ටයර් නිෂ්පාදිත වර්ෂය, සාමාන්‍ය ධාවනය කළහැකි දුර, බර, ධාරිතාවය වැනි කරුණු ඇතුළත් කර නොතිබුණි. අළුතින් ටයර් යෙදීමේදී පැරණි ටයර් වලින් ධාවනය කරන ලද දුර ප්‍රමාණය සනාථ කර නොතිබුණි.

(ආ) මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා අනුමත කරන ලද උපමාන පාදක සංවර්ධන ව්‍යාපෘති 167 කින් ව්‍යාපෘති 21 ක් පමණක් 2017 නොවැම්බර් 10 දින වන විට අවසන් කර තිබුණි. ව්‍යාපෘති 146 ක් නිමකිරීම සඳහා ඉතිරිව තිබූ කාලය මාස 01 දින 20 ක් පමණ විය.

(ඇ) පළාත් පාලන ආයතනවල කසල කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා මොනරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 8 කට ලබාදී තිබුණු රු. 546,480 ක් වටිනා කසල බඳුන් 1980 ක් ගෘහ ඒකක වලට බෙදා නොහැර පළාත් පාලන ආයතනවල ගබඩා කර තිබුණි.

(ඈ) ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය සතුව පරිපූර්ණ කාර්ය මණ්ඩලයක් සහ පහසුකම් සහිත වාහන අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පැවතියදී, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සතු වාහන 05 ක් බාහිර පෞද්ගලික ආයතන වෙතින් අළුත්වැඩියා කරගෙන රු. 2,239,210 ක් වැයකර තිබුණි.

(ඉ) බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ රු.11,821,596 ක් වටිනා මන්දගාමී භාවිතයක් සහිත ඖෂධ අයිතම 48 ක් වූ අතර ඖෂධ අවශ්‍යතාවය සහිත රෝහල් හඳුනාගෙන බෙදාහැර නොතිබුණි.

(ඊ) දෙමෝදර ප්‍රාදේශීය රෝහලේ 2017 සැප්තැම්බර් මස මධ්‍යම රාත්‍රී වාර්තා අනුව නේවාසික රෝගීන් නොමැති අවස්ථා වලදී හා රෝගීන් සංඛ්‍යාව 06 ට අඩු අවස්ථා වලදී ද හෙද නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩියෙන් සේවයේ යෙදූ අවස්ථා 21 ක් නිරීක්ෂණය විය. උදැසන සහ සවස සේවා මුරයන් සඳහා ද රෝගීන්ට සාපේක්ෂව වැඩි හෙද නිලධාරීන් ප්‍රමාණයක් අතිකාල සේවයේ යොදවා තිබුණි.

(උ) රෝහල් කළමනාකරණ කාර්ය සංග්‍රහයේ 3.8 ඡේදය ප්‍රකාරව ප්‍රසූති 20 ක් සඳහා එක් පවුල් සෞඛ්‍ය සේවිකාවක් අනුමත කර තිබුණ ද, දෙමෝදර ප්‍රාදේශීය රෝහල තුළ 2017 වර්ෂයේදී සිදුවී තිබුණු ප්‍රසූතීන් 06 ක් සඳහා 2017 පෙබරවාරි සිට 2017 දෙසැම්බර් දක්වා පවුල් සෞඛ්‍ය සේවිකාවන් දෙදෙනෙකු වෙනුවෙන් රු.559,090 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. රෝහල් පරිශ්‍රය තුළ නිල නිවාස පැවතියද අතිකාල ගෙවීම් අවම කිරීමේ අරමුණින් ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 06 වගන්තිය ප්‍රකාරව ඇමතුම් පදනම (on Call) ක්‍රමය භාවිතා කර නොතිබුණි.

(ඌ) ඌව පළාත තුළ වෙසෙන අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක්වූ ළමයින්ගේ රැකවරණය හා සංවර්ධනය උදෙසා පවත්වන ආයතන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, පරිපාලනය හා මෙහෙයවීම සඳහා ද ඊට ආනුශංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලසීම සඳහා වූ ඌව පළාත් සභාවේ 2013 අංක 01 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් රීති සකස් කර නොතිබුණි.

(එ) දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය හා ආධාර ලබාදීම පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වුවද ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්ගේ 2015 දෙසැම්බර් 28 දිනැති අංක ඌව/පරි/සං/02/02/10 ලිපිය මගින් දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා නිශ්චිත ප්‍රඥප්තියක් නොමැතිකමින් නඩත්තු ආධාර ගෙවිය නොහැකි බව අදාල දිවා සුරැකුම් මධ්‍යස්ථාන වෙත දන්වා තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වනවිටත් නඩත්තු ආධාර ගෙවීමට උචිත ක්‍රමවේදයක් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි.

(ඒ) පරිවාස නිලධාරින් 07 දෙනෙකු විසින් මාසික අධීක්ෂණ වාර්තා ඌව පළාත් පරිවාස කොමසාරිස් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඔ) ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් කතරගම නැණසරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානයට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද ඕවර්සියර් නිලධාරින් දෙදෙනෙකු විසින් දරුවන් අපහරණයට ලක් කිරීම නිසා දරුවන්ගේ මානසික තත්ත්වය පිරිහීමට ලක්වී අධ්‍යාපන කටයුතු අඩාල වී තිබුණි.

(ඕ) සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් මිලදී ගන්නා ලද රු.1,891,500 ක් වටිනා උපකරණ 215 ක වගකීම් කාලය ඉක්මවා තිබුණ ද ප්‍රතිලාභීන් හඳුනාගෙන බෙදාදී නොතිබුණි.

(ක) හාලිඇල ප්‍රාදේශීය සභාවට අයත් කඩිගමුව වත්ත ගෙවන අම්බලම වත්ත නැමැති අක්කර ¾ ක වපසරියක පිහිටි සඳරුස් ප්‍රජාශාලා ගොඩනැගිල්ල සහ ඉඩම මසකට රු.500 ක් බැගින් වූ කුලියකට 2010 ජනවාරි 11 දින සිට ඉදිරි වර්ෂ 05 ක් සඳහා පෞද්ගලික පාර්ශවයකට බදු දී තිබුණි. බදු ගිවිසුම 2015 ජනවාරි 10 දිනයෙන් අවසන් වී තිබුණු නමුත් ගොඩනැගිල්ල සහ ඉඩම සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

(ග) 2017 වර්ෂය තුළ බ/ශ්‍රී සංඝබෝධි විද්‍යාලයේ විදුහල්පතිනියගේ, ගුරු භවතුන් තිදෙනෙකුගේ රසායනාගාර සහායකගේ සහ කාර්යාල සහායකගේ නිවාඩු දිනයන් නිවාඩු ලේඛනයට ඇතුළත් නොකළ අවස්ථා 30 ක් නිරීක්ෂණය වූ අතර ගුරුභවතුන් දෙදෙනෙකු විද්‍යාගාර සහායකවරයකු සහ කාර්යාල කාර්ය සහායකයකු අවස්ථා 21 ක දී නිවාඩු අනුමැතියකින් තොරව සේවයට වාර්තා කර නොතිබුණි.

(ච) ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 10 වගන්තියේ විධිවිධාන අනුව සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දිනවල සේවය කිරීම වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරිනියට රු. 61,102 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. ඉටුකල රාජකාරි වෙනුවෙන් කළවැඩ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඬ) බ/කටුගහ ශ්‍රී ධම්මාලංකාර විද්‍යාලයේ පාසැල් සංවර්ධන සමිතිය විසින් 80'×20' පාසැල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැරව රු. 487,585 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි.

7.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සියඹලාණ්ඩුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ගබඩා කර තිබුණු කල්ඉකුත් වූ හා නියමිත ගුණත්වයෙන් තොර ඖෂධ හා පාරිභෝජ්‍ය ශල්‍ය ද්‍රව්‍ය වර්ග 12 ක් විනාශ කර නොතිබුණි.

(ආ) 1994 සිට 2014 වර්ෂය දක්වා මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් සියඹලාණ්ඩුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට ලැබී තිබුණු වර්ග 4 කට අයත් උපකරණ ඒකක 54 ක් භාවිතයෙන් ඉවත්කර තිබුණ ද අපහරණය කර නොතිබුණි.

(ඇ) බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සතු වාහන 06 ක් ධාවනයෙන් ඉවත් කර වසර 05 ක් ඉක්මවා තිබුණ ද අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**(ඈ)** දිසා රෝහල්, පර්යන්ත ඒකක සහ ග්‍රාමීය රෝහල් කළමනාකරණය කිරීම පිළිබඳ කාර්ය සංග්‍රහයේ 19 වන පරිච්ඡේදය ප්‍රකාරව කල් ඉකුත්වූ ඖෂධ සාමාන්‍ය ඖෂධ වලින් වෙන්ව ගබඩා කළ යුතු වුවද, ගිරාඳුරුකෝට්ටේ ප්‍රාදේශීය රෝහලේ රු.402,552 ක් වටිනා කල් ඉකුත්වූ ඖෂධ හා කල් ඉකුත්වීමට ආසන්න ඖෂධ වර්ග 13 ක් සහ බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කර්යාලයේ කල් ඉකුත් වූ ඖෂධ වර්ග සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉහත කාර්ය සංග්‍රහයේ 19.7 පරිච්ඡේදය ප්‍රකාරව ඖෂධ පොළොවේ සිට අඩුම වශයෙන් සෙ.මී.10 ක් ඉහළින් සහ කුමන හෝ බිත්තියකට සෙ.මී.35 ක් දුරින් තැන්පත් කළයුතු වුවද, බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ඖෂධ විශාල ප්‍රමාණයක් එළිමහනේ රඳවා තිබුණි.

(ඊ) ගිරාඳුරුකෝට්ටේ ප්‍රාදේශීය රෝහල විසින් ඉල්ලුම් නොකළ රු.4,497,928 ක් වටිනා ඖෂධ වර්ග 128 ක් හා ඉල්ලුම් කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් රු.2,733,118 ක් වටිනා ඖෂධ වර්ග 85 ක් සපයා තිබීම හේතුවෙන් සැලකිය යුතු ඖෂධ තොගයක්

ගබඩා පරිශ්‍රයේ රඳවාගෙන තිබුණි. මෙම ඖෂධ භාවිතා නොකිරීම හා අතිරික්තතාවය හේතුවෙන් කල් ඉකුත්වීමේ අවදානමකට ලක්ව තිබුණි.

7.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්
-----------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 සහ 2017 වර්ෂවලදී මාතෘ සායනවලට බෙදාදීම සඳහා මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් සියඹලාණ්ඩුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට ලැබී තිබුණු වර්ග 8 කට අයත් උපකරණ හා ද්‍රව්‍ය 79 ක් ද, සියඹලාණ්ඩුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියන්ට අයත් නිල නිවාස 8 ක් ද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 2009/09 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් ආයතන 135 ක් සඳහා 2017 නොවැම්බර් 14 දින ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රු.7,695,000 ක වියදමක් දරා තිබුණු අතර 2018 අගෝස්තු 31 දින දක්වා භාවිතයට ගෙන නොතිබුණි.

(ඇ) බදුල්ල ළය චිකිත්සාගාරයේ ළය රෝග සම්බන්ධ Total Lung Capacity සහ DLCO යන පරීක්ෂණ සිදුකිරීම සඳහා ඌව පළාත සඳහා ඇති එකම Cosmed Quart PFT 4 Lung Function යන්ත්‍රය 2016 වර්ෂයේ සිට අක්‍රීය වී තිබුණි.

(ඈ) මහියංගණය මූලික රෝහලේ රුධිර කාන්දු පෙරණ යන්ත්‍ර 03 ක් නිශ්ක්‍රීයව ද ශල්‍ය වෛද්‍යවරයෙකු නොමැති වීම හේතුවෙන් ENT ඒකකය ද මාස 04 ක පමණ කාලයක සිට අක්‍රීයව පැවතුණි.

(ඉ) මහියංගණය මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය සඳහා 2016 නොවැම්බර් 28 දින රු.4,500,000 කට මිලදීගත් Continuous Renal Replacement Therapy යන්ත්‍රය සමඟ වසර 10 ක් පුරා සැපයුම්කාර නියෝජිත ආයතනයෙන් පාරිභෝජ්‍ය කොටස් ලබාගැනීමට හැකියාව තිබුණ ද, ඒ සඳහා නීත්‍යානුකූල ගිවිසුමකට ඇතුළත් නොවීම හේතුවෙන් පාරිභෝජ්‍ය කොටස් ලබාගැනීමට නොහැකිවීම මත 2017 වර්ෂය පුරාම යන්ත්‍රය ක්‍රියාවිරහිතව නිශ්කාර්යව පැවතුණි.

7.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බ/සුජාතා මහා විද්‍යාලයේ 90'×25' දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම
------------------------------------------------------------------------
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් කොන්ත්‍රාත්කාර ආයතනයක් සමඟ 2015 මැයි මස 05 දින රු. 8,327,039 ක ගිවිසුමකට එළඹ තිබුණි. අත්‍යවශ්‍ය අයිතම 15 ක් ඇස්තමේන්තුවට ඇතුළත් නොකිරීම නිසා රු. 727,983 ක් වූ අමතර හා බාහිර වැඩ සඳහා 2015 නොවැම්බර් 24 දින අතිරේක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි.

(ආ) වැලිමඩ මූලික රෝහලේ නව ඖෂධාගාරය ඉදිකිරීම

---

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් පළමු වර ලංසු කැඳවීමෙන් තෝරාගන්නා ලද කොන්ත්‍රාත්කරු වෙත 2016 ජුනි 27 දින රු. 11,126,986 කට ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණු අතර දෙවන ලංසුකරු වෙත යොමු නොවී දෙවනවර ලංසු කැඳවා තිබුණි. පළමුවර ලංසු කැඳවීමේදී පළමු ලංසුකරු හා දෙවන ලංසුකරුගේ මිලගණන් අතර වෙනස රු. 58,733 ක් වූ අතර දෙවන වර ඉදිරිපත් කරන ලද එකම ලංසු කරුගේ මිලගණන් රු. 14,012,035 ක් වී තිබුණි. දෙවන වර ලංසුකරු ද ප්‍රතික්ෂේප කර තෙවනවර ලංසු කැඳවා රු. 13,957,973 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. පළමුවර ලංසු කැඳවීමේදී කර්මාන්තයේ ඉංජිනේරු ඇස්තමේන්තුවේ වටිනාකම රු. 15,483,914 ක් වූ අතර තෙවන වර ලංසු කැඳවීමේදී ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රු. 18,164,039 ක් ලෙස රු. 2,725,125 කින් වැඩි වී තිබුණි.

(ඇ) ඌව පළාත් සභාවේ නිලධාරින් සඳහා පස්මහල් නිවාස සංකීර්ණයක් ඉදිකිරීම

---

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් ප්‍රසම්පාදනයකර තෝරාගන්නා ලද කොන්ත්‍රාත්කරු වෙත 2016 දෙසැම්බර් 06 දින රු. 88,184,632 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර කොන්ත්‍රාත්කරු ගිවිසුම අත්සන් කිරීම පැහැර හැර තිබුණි. ලංසු සුරක්ෂණ ඇපකරයේ වටිනාකම වූ රු. 940,000 ක මුදල රාජ්‍ය ආදායමට ගැනීම වලක්වාලමින් කොන්ත්‍රාත්කරු බදුල්ල දිසා අධිකරණයේ ගොනුකරන ලද නඩුව, නැවත මිලගණන් කැඳවීම සඳහා දැරීමට සිදුවන වියදම වූ රු. 248,388 ක් අයකර ගැනීමෙන් සමථයකට පත්කර තිබුණි.

දෙවනවර ලංසු කැඳවීමෙන් තෝරාගත් කොන්ත්‍රාත්කරු වෙත 2017 අගෝස්තු 31 දින රු. 112,169,390 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර පළමුවර ලංසු කැඳවීමේදී ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු වටිනාකමට වඩා රු. 23,984,758 කින් වැඩි වී තිබුණි.

දෙවනවර ලංසු කැඳවීමේ ජාතික පුවත්පත් දැන්වීම අනුව පිළිගත් වාණිජ බැංකුවක් නොවන රක්ෂණ ආයතනයක ලංසු සුරක්ෂණ ඇපකරය තාක්ෂණ කමිටු ඇගයීමේදී පිළිගෙන තිබුණු අතර, රක්ෂණ ආයතනය ඉදිරිපත් කරන ලද වටිනාකම රු. 34,688,817 ක් වූ ලංසු සුරක්ෂණ අත්තිකාරම් හා කාර්යසාධන සුරක්ෂණ ඇපකර නීත්‍යානුකූල නොවන ඒවා බව තහවුරු විය.

(ඈ) බ/බණ්ඩාරවෙල දෙමළ මහා විද්‍යාලය 110'×25' සිව්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම

---

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2013 දෙසැම්බර් 31 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) විසින් කොන්ත්‍රාත්කාර ආයතනයක් සමඟ රු. 15,798,212 ක ගිවිසුමකට එළඹ තිබුණි. කර්මාන්තයේ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී වටිනාකම රු. 3,309,621 ක් වූ අත්‍යවශ්‍ය විෂයයන් 4 ක් අත්හැරී තිබුණි. 2017 සැප්තැම්බර් 20 දින පරීක්ෂණ අවස්ථාව වන විට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණු අතර බිම් මහලේ බිත්තිවල කොටස් ඉදිකර කොන්ක්‍රීට් තට්ටුව (Slab) යොදා තිබුණි. වසර 4 ක පමණ කාලයක් තුළ වැඩ අවසන් නොකිරීමෙන් ප්‍රයෝජනයට ගත නොහැකිව පැවති අතර ගොඩනැගිල්ල ඉදිකර තිබුණු භූමියේ පැවති පැරණි ගොඩනැගිල්ලේ පංති කාමර 03 ක් හා පුස්තකාලය ඉවත් කර තිබුණි. අඩක් නිමකරන ලද බිම් මහලේ අවදානම් පරිසරය තුළ පාසල් ළමුන් අධ්‍යාපනය ලබමින් පැවතුනි. තවද ගොඩනැගිල්ල තුළට වැසි ජලය ගලා එමින් පැවති අතර කොන්ක්‍රීට් තට්ටුවේ (Slab) වැර ගැන්නුම් කම්බි දිරාපත්ව පැවතුනි.

(ඉ) බ/දඹේතැන්න අංක 2 දෙමළ විද්‍යාලයේ ගුරු නිවාසය ඉදිකිරීම

-----------------------------------------------------------------

ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් බ/දඹේතැන්න අංක 2 දෙමළ විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතිය සමඟ 2006 නොවැම්බර් 10 දින රු. 1,530,980 කට ගුරුනිවාසයක් ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත වී තිබුණි. ඉදිකිරීම් 2007 පෙබරවාරි 10 දින අවසන් කළයුතු වුවද, 2017 සැප්තැම්බර් 20 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. වසර 10 ක පමණ කාලයක් අඩක් වැඩ නිමකර තිබුණු ගොඩනැගිල්ලේ කොටස් දිරාපත්ව ජරාවාස වී පැවති අතර භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතුනි. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා පළමු කොටස් ගෙවීම වශයෙන් රු. 337,175 ක් වැයකර තිබුණු අතර දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

(ඊ) බුත්තල කාර්මික ජනපදයට අයත් පිවිසුම් මාර්ග, අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම, පැතිකාණු සහ කම්බිවැට ඉදිකිරීම

--------------------------------------------------------------------------

ඉහත කර්මාන්තය සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 14 දින ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත රු.22,122,500 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට 2017 ජුනි 01 දින අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබුණි. 2017 ජුනි 25 දින වන විටද ඒ සඳහා අනුමැතිය නොලැබීමෙන් ලංසුකරු දෙවනවරට ඉදිරිපත් කළ ලංසු සුරක්ෂණයේ කාලය ද ඉක්ම ගොස් තිබුණි.

(උ) ගලඋඩ - කන්දකැටිය - කරමැටිය මාර්ගය ඉදිකිරීම

-------------------------------------------------------

ලෝක බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක වූ ඉහත කර්මාන්තයේ ගෙවීම් පිළිබඳ ඇතිව තිබුණු මතභේදාත්මක තත්ත්වය නිරාකරණය සඳහා බේරුම්කරුවකු වෙත යොමුකර තිබුණු අතර, බේරුම්කරණයේදී 1995 අංක 11 දරන බේරුම්කරණ මණ්ඩල පනතේ 15(1) වගන්තියට පටහැනිව ඉටු නොකළ වැඩ සඳහා රු.214,336,256 ක මුදලක් ගෙවීමට තීරණය කර තිබුණි.

7.6 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

7.6.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා කාර්යාල (පාසල් කාර්ය මණ්ඩලය හැර)

-----------------------------------------------------------

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 1336 | 940 | 396 | - |
| (ii) | තෘතියික මට්ටම | 298 | 189 | 109 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | ද්විතික මට්ටම | 7520 | 6432 | 1088 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 5295 | 5185 | 110 | - |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 52 | 955 | - | 903 |
| | එකතුව | 14501 | 13701 | 1703 | 903 |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | විදුහල්පතිවරුන් | 1077 | 750 | 327 | - |
| (ii) | ගුරුභවතුන් | 16384 | 17456 | - | 1072 |
| (iii) | සහය කාර්ය මණ්ඩලය | 1326 | 1768 | - | 442 |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 1117 | - | 1117 |
| | එකතුව | 18787 | 21091 | 327 | 2631 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට ගුරු සේවයට 1072 ක් හා සහාය කාර්ය මණ්ඩලයට 442 ක් ද අනියම්,තාවකාලික, කොන්ත්‍රාත් සේවකයින් 1117 දෙනෙකු අතිරික්තව සේවයේ යොදවා ගෙන තිබුණ ද, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ii) විදුහල්පති තනතුරු පුරප්පාඩු 327 ක් සම්පූර්ණ කර නොතිබුණි.

මුදල් රෙගුලාසි 95(1) ප්‍රකාරව අතිරික්ත, අනියම් හා කොන්ත්‍රාත් සේවකයන්ගේ සේවයේ හදිසි හා අත්‍යාවශ්‍ය බව සහ වැටුප් ගෙවීම සඳහා වැය ශීර්ෂවල සලසා ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් බව තහවුරු කර නොතිබුණි.

7.6.2 පළාත් සභා අනිකුත් කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව මිනින්දෝරු තනතුරු 3 ක් පුරප්පාඩු පැවතියදී මිණුම් ක්ෂේත්‍ර සහායකවරුන් 7 දෙනෙකු නිෂ්කාර්යව සේවයේ යොදවාගෙන තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පාසැල් කාර්ය මණ්ඩලය හැර ඌව පළාත් සභාවේ පුරප්පාඩු සේවක සංඛ්‍යාව 1703 ක් ද අතිරික්ත සේවක සංඛ්‍යාව 903 ක් ද විය.

පාසැල් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සේවක සංඛ්‍යාව 327 ක් ද අතිරික්ත සේවක සංඛ්‍යාව 2631 ක් ද විය.

(ඇ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 උපවගන්තිය අනුව වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත් කිරීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවද එම්.එන්. 03 වැටුප් තලයට අයත් පළමු ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරිනියක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/III ශ්‍රේණියට අයත් පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ 2014 මැයි 02 දින සිට පූර්ණකාලීනව රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ III ශ්‍රේණියේ නිලධාරියෙකු 2012 පෙබරවාරි 01 දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ කර්මාන්ත අධ්‍යක්ෂ තනතුර සඳහා වැඩ බැලීමට පත්කර තිබුණි.

(ඉ) පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ ජොෂ්ය උපදේශක තනතුරු 20 ක් අනුමත වී තිබුණද තනතුරු 13 ක්ම පුරප්පාඩුව පැවතුනි.

(ඊ) **(i)** 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන ජනාධිපති චක්‍රලේඛය අනුව කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරයෙකුට හිමි දීමනා හා කාර්ය මණ්ඩලය, පළාත් සභාවේ අමාත්‍යවරුන්ට අදාල කරගෙන තිබුණි. චක්‍රලේඛයේ 1.3 ඡේදය අනුව අනුමත කාර්ය මණ්ඩලයට අදාල බඳවා ගැනීම් විෂය භාර අමාත්‍යාංශයෙන් කලයුතු වුවද, පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් පත්කරන ලද නිලධාරින් 14 දෙනෙකුට 2017 වර්ෂයේදී රු. 5,085,222 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. අමාත්‍යවරුන් සඳහා 40 දෙනෙකුගෙන් යුත් අතිරික්ත කාර්ය මණ්ඩලයක් විෂයභාර අමාත්‍යාංශවලින් හා ඌව පළාත් සභාවේ වෙනත් ආයතනවලින් අනුයුක්ත කර තිබුණු අතර, 1990 අංක 02 දරන ඌව පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය හා 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන ජනාධිපති චක්‍රලේඛයට අනුකූල පරිදි ඌව පළාත් සභාවේ සභාපතිවරයාට, හිමි වියයුතු කාර්යය මණ්ඩලය සභා ලේකම් කාර්යාලය විසින් සපයා තිබිය දී බදුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ රසායනාගාර සේවකයකු අනුයුක්ත කර එම කාර්යාලයෙන් 2014 පෙබරවාරි මස සිට 2017 ඔක්තෝබර් මස දක්වා රු. 864,090 ක වැටුප් ගෙවා තිබුණි.

**(ii)** ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2009 මාර්තු 24 දිනැති අංක **NSCC/2/1/6/**1/1 **(II** වෙළුම**)** දරන ලිපිය ප්‍රකාරව ඌව පළාත් සභාවේ සියළුම මන්ත්‍රීවරුන්ට හිමි වියයුතු කාර්ය මණ්ඩලය සඳහා සභා ලේකම් කාර්යාලය විසින් වැටුප් ගෙවා තිබිය දී එයට අමතරව මන්ත්‍රීවරුන් 11 ක් විසින් ඌව පළාත් සභාවට අයත් වෙනත් ආයතන වලින් නිලධාරින් 11 දෙනෙකු අනුයුක්ත කර එම නිලධාරින්ට 2017 වර්ෂයේදී පළාත් සභා අරමුදලින් රු. 4,767,835 ක වැටුප් ගෙවා තිබුණි.

**(ii)** 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන ජනාධිපති චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ මන්ත්‍රීවරයකු සඳහා මන්ත්‍රී කාර්ය මණ්ඩලයේ ලිපිකරු, යතුරු ලේඛක හා කාර්යාල කාර්ය සහායක නිලධාරින් 03 දෙනෙකු සඳහා වැටුප් ගෙවිය හැකි වුවද, ඌව පළාත් සභාවේ විෂය භාර අමාත්‍යවරුන් හා සභාපතිවරයා සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අමතරව මන්ත්‍රීවරයකුට අනුමත කාර්ය මණ්ඩලය 03 දෙනෙකු බැගින් නිලධාරින් 18 දෙනෙකු වැඩියෙන් අනුයුක්ත කර සභා ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂය තුල රු. 6,273,360 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

7.6.3 අධ්‍යාපන සම්බන්ධ කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බ/සුජාතා මහා විද්‍යාලයේ වැටුප් ලැයිස්තුවෙන් වැටුප් ලබන ගුරුභවතුන් තිදෙනෙකු දීර්ඝ කාලය සිට වෙනත් කාර්යාලවලට අනුයුක්ත කර තිබුණි.

(ආ) පළාතේ පාසල් අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන් 124 දෙනෙකු අතිරික්තව පැවති අතර විදුහල්පතිවරුන් 442 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුනි.

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛයට පටහැනිව පාසැලක සිටිය යුතු ගුරු සංඛ්‍යාව ඉක්මවා බ/විහාරමහාදේවි බාලිකා විද්‍යාලයේ ගුරු භවතුන් 15 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි.

(ඈ) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව ගුරු භවතකු විසින් සතියකට කාලච්ඡේද 30-35 අතර ප්‍රමාණයක් ඉගැන්වීමේ නිරත විය යුතු වුවද, බ/ ශ්‍රී සංඝබෝධි විද්‍යාලයේ ගුරුභවතුන් 25 දෙනෙකු සහ බ/සුජාතා මහා විද්‍යාලයේ ගුරුභවතුන් 45 දෙනෙකු එම කාලච්ඡේද සංඛ්‍යාව ආවරණය කර නොතිබුණි. කිසිදු කාලච්ඡේදයක් හෝ ඉගැන්වීමේ නිරත නොවන ගුරු භවතුන් සංඛ්‍යාව 12 ක් විය.

(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛයට පටහැනිව බ/සුජාතා මහා විද්‍යාලයේ ගුරු කාර්ය මණ්ඩලයේ 28 ක අතිරික්තයක් පැවැති අතර බ/ ශ්‍රී සංඝබෝධි විද්‍යාලයේ අතිරික්ත ගුරු සංඛ්‍යාව 18 ක් සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ අතිරික්ත සංඛ්‍යාව 01 ක් විය.

7.7 බැංකු සැසඳුම්

---------------

නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොකළ චෙක්පත්

----------------------------------------------------------------------------

(අ) කලාප අධ්‍යාපන කාර්යාල 04 ක බැංකු ගිණුම් 4 කට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට නිකුත් කල දින සිට මාස 6 ක් ඉක්ම වූ රු.57,891 ක් වටිනා චෙක්පත් 36 න් 2018 අප්‍රේල් 30 දිනට සකස් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව රු. 50,374 ක් වටිනා චෙක්පත් 27 ක් සම්බන්ධයෙන් ඌව පළාත් මුදල් රීති 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමේ මාස 6 ඉක්මවන ලද රු.324,445 ක් වටිනා නොගෙවූ චෙක්පත් 250 ක් පළාත් සභා මුදල් රීති 396 අනුව කටයුතු නොකර තැන්පත් ගිණුමට මාරුකර තිබුණි.

7.8 පළාත් පාලන ආයතන අධීක්ෂණය

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතන වලට ලැබිය යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් රු. 266,263,635 ක් විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට අය විය යුතු උසාවි දඩ රු. 94,940,975 ක් හා මුද්දර ගාස්තු රු. 118,671,367 ක් පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතුව තිබුණි.

(ඇ) ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල නිලධාරින්ට හා නියෝජිතයින්ට පනවා තිබුණු අධිභාර වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු. 6,417,562 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

8. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

8.1 ක්‍රියාකාරී සැලැස්ම
---------------------

ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතන 12 ක සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි.

8.2 අභ්‍යන්තර විගණනය සහ විගණන හා කළමනාකරණ කමිටු
----------------------------------------------------------------

(අ) කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක **DMA/2009(1)** දරන චක්‍රලේඛය ප්‍රකාරව ආයතන 72 ක සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණනය මගින් කරන ලද අනාවරණය කර ගැනීම් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරම් ක්‍රියාත්මක කර නොතිබුණි.

8.3 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතන 12 ක් විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර නොතිබුණි.

8.4 පාරසරික හා සමාජ වගකීම් ඉටුකිරීම
---------------------------------------

ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් අප ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ප්‍රතිකාරක අංගණයක් (Treatmet plant) ස්ථාපිත කර නොතිබුණි.

8.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම
---------------------------------

පසුගිය වර්ෂ සඳහා ඌව පළාත් සභාවේ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කළ දිනය | වාර්තාව සභාගත කළ දිනය |
|---|---|---|
| 2012 | 2014.08.27 | 2015.04.23 |
| 2013 | 2015.02.10 | 2016.04.28 |
| 2014 | 2015.09.21 | 2016.07.14 |
| 2015 | 2016.12.06 | 2017.02.20 |
| 2016 | 2017.08.21 | 2017.09.28 |

9. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි පළාත් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම |
| (ආ) | ආදායම් කළමනාකරණය | නව ආදායම් ප්‍රභවයන් හඳුනානොගැනීම සහ හිඟ ආදායම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඇ) | අභ්‍යන්තර පාලනය | i. අධීක්ෂණ දුර්වලතා.<br>ii. පසුවිපරම් ක්‍රියාත්මක නොකිරීම.<br>iii. ප්‍රමාණවත් ගිණුම්කරණ ලේඛන නොපැවැත්වීම. |
| (ඈ) | පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය | අධිභාර සහ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | i. අනුමත කාර්ය මණ්ඩල සීමාව ඉක්මවා සේවකයින් බඳවා ගැනීම.<br>ii. අතිරික්ත කාර්ය මණ්ඩල සේවයේ යොදවා ගැනීම. |
| (ඊ) | වත්කම් කළමනාකරණය | සියළුම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම සහ සියළුම වත්කම් ප්‍රයෝජනයට නොගැනීම |
| (උ) | කොන්ත්‍රාත් කළමනාකරණය | i. විධිමත් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය නොකිරීම.<br>ii. ප්‍රමාද වී ව්‍යාපෘති ආරම්භ කිරීම.<br>iii. කොන්ත්‍රාත් පිරිනැමීමේදී කළමනාකරණය විසින් නිවැරදි තීරණ නොගැනීම.<br>iv. අධීක්ෂණ දුර්වලතා |